# හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී.
## 2024/25 සහ 2025/26 වසර සඳහා නව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම/ ලියාපදිංචිය අලුත් කිරීම

**2024/25 සහ 2025/26 වසර තුළ භාණ්ඩ/ සේවා සැපයීම සඳහා හැටන් නැෂනල් බැංකුවෙහි ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන්/ සේවා සපයන්නන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**2024/25 සහ 2025/26 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම/ ලියාපදිංචිය අලුත් කිරීම**

හැටන් නැෂනල් බැංකුවේ ඉහත වර්ෂයන් සඳහා නව සැපයුම්කරුවන් හා ලියාපදිංචිය අලුත් කරන සැපයුම්කරුවන්හට අවශ්‍ය මාර්ගෝපදේශ සහ ලේඛන පහත සබැඳි/ URL වෙත ප්‍රවේශ වීමෙන් ලබාගත හැකිය.
01. https://www.hnb.net (e-tendering) හෝ
02. බැංකුවේ වෙබ් අඩවිය (www.hnb.net) වෙත පිවිස එම වෙබ් අඩවියේ පහතින් දිස්වන e-tendering පිවිසුම හා සම්බන්ධ වන්න.

| | |
|---|---|
| නව සැපයුම්කරුවන්/ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ දැනට සිටින සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම | අ. ලියාපදිංචි කිරීමේ/ ලියාපදිංචිය අලුත් කිරීමේ පරිශීලක මාර්ගෝපදේශය (user guide) බැංකුවේ ඊ-ටෙන්ඩර් (e-Tendering) පිවිසුමෙහි ඇත.<br>ආ. ලියාපදිංචි වීම සඳහා ඊ ටෙන්ඩර් (e-tendering) පිවිසුමෙහි ඇති අංක 06 දරන ඇමුණුමෙහි සඳහන්ව ඇති අවශ්‍ය ලිපි ලේඛන ලැයිස්තුව (list of documents) ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න. වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති ලැයිස්තුගත කාණ්ඩ/ නිෂ්පාදන අනුව, නිෂ්පාදන/ සේවා සඳහා සැපයුම්කරුවන්/ සේවා සපයන්නන් ලියාපදිංචි වීම අවශ්‍ය වේ. **එක් කාණ්ඩයකට ආපසු නොගෙවන පරිදි රු. 10,000/=** (දස දහසක් පමණි) ගාස්තුවක් අය කෙරේ.<br>ඇ. බැංකුව සමග සම්බන්ධතාව (සන්නිවේදනය) සඳහා **එක් විද්‍යුත් තැපැල් ලිපිනයක්** ලබා දෙන ලෙස සැපයුම්කරුවන්ගෙන්/ සේවා සපයන්නන්ගෙන් ඉල්ලා සිටියි. ටෙන්ඩර් ඇතුළු සියලුම ඉදිරි ලිපි හුවමාරු කටයුතු ලියාපදිංචියෙන් පසු මෙම විද්‍යුත් තැපැල් ලිපිනයට පමණක් දැනුම් දෙන බව කරුණාවෙන් සලකන්න.<br>ඈ. ලියාපදිංචිය/ ලියාපදිංචිය අලුත් කිරීම නව **ලියාපදිංචි දිනයේ සිට වසර 2ක් වලංගු වේ.**<br>ඉ. සම්පූර්ණ කරන ලද ලේඛන වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා පමණක් කොළඹ, ටී. බී. ජායා මාවත, අංක 479 ලිපිනයෙහි HNB ටවර්ස් 16 වන මහලේ 'බැංකු සේවා අංශය' වෙත භාර දිය යුතුය.<br>ඊ. ඉහත 'ඉ' වගන්තිය ප්‍රකාරව කටයුතු කළ නොහැකි අවස්ථාවක නම්, මුද්‍රා තබා 'ජ්‍යෙෂ්ඨ කළමනාකරු ප්‍රසම්පාදන' නමට, **ලබා දී ඇති ලිපිනයට** ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, ලිපි කවරයේ වම් කෙළවරේ 'සැපයුම්කරුවන් ලියාපදිංචිය' ලෙස සටහන් කළ යුතුය.<br>උ. සැපයුම්කරුවන්/ සේවා සපයන්නන් ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසු වැඩ කරන දින 10ක් තුළ ලේඛන භාරගත් බවට සනාථ කරනු ලැබේ. |
| ගාස්තු | අ. සමාගමේ නමට යොමුව දක්වමින් "HNB o/a Banking Services" නම යටතේ **ගිණුම් අංක 003010364772** වෙත චෙක්පත්/ මුදල් තැන්පතු/ මාර්ගගත මුදල් හුවමාරු (Online transfer/ CEFT) ක්‍රම මගින් ගෙවීම් සිදුකළ හැක. අයදුම්පත වලංගු වන්නේ අදාළ චෙක්පත් නිෂ්කාෂණය වීමෙන් පසුවය. (ගෙවිය යුතු මුදල එක කාණ්ඩයකට රු. 10,000/- බැගින් තෝරාගන්නා ලද කාණ්ඩ සංඛ්‍යාව අනුව ගණනය කළ යුතුය.)<br>ආ. ගෙවීම් සනාථ කිරීම සඳහා තැන්පතු පත්‍රිකාවේ/ මාර්ගගත මුදල් හුවමාරුවේ (Online transfer) පැහැදිලි පිටපතක් HNB බැංකු සේවා අංශය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**නියමයන් සහ කොන්දේසි**
1. කිසිදු හේතුවක් ඉදිරිපත් කිරීමකින් තොරව ඕනෑම අයදුම්පතක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.
2. වංචනික ක්‍රියා, ව්‍යාජ භාණ්ඩ සැපයීම, ඇණවුමේ ප්‍රමිතියට නොමැති භාණ්ඩ හෝ සේවා සැපයීම/ කාර්ය සාධනයෙන් තොර භාණ්ඩ සැපයීම, වංචනික තොරතුරු සැපයීම, අවශ්‍යතාව පරිදි නියමිත වේලාවට භාණ්ඩ හෝ සේවා සැපයීමට අපොහොසත් වීම, සමාගමට විරුද්ධව නඩු පැවරී තිබීම වැනි හේතු මත ලියාපදිංචි ඕනෑම සැපයුම්කරුවකුගේ/ සේවා සපයන්නකුගේ නම ලේඛනයෙන් ඉවත් කිරීමට/ අසාදු ලේඛනගත කිරීමට බැංකුවට අයිතිය ඇත.

වැදගත්
1. අයදුම්කරුවන් සතුව ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ සංස්ථාපිත සහතිකය තිබිය යුතුය.
2. බැංකුව විසින් ඉල්ලා සිටින්නේ නම් ව්‍යවස්ථාපිත/ නීතිමය අවශ්‍යතාවක් වෙනුවෙන් ලබාගත් වෙනත් සහතික අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.
3. සාමාන්‍යයෙන් මිල ගණන්/ ටෙන්ඩර් කැඳවීම සිදු කරනු ලබන්නේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන්/ සේවා සපයන්නන්ගෙන් පමණි. එසේ වුවද නිශ්චිත නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහා ලියාපදිංචි සුදුසු සැපයුම්කරුවන් නොමැති අවස්ථාවකදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්/ සේවා සපයන්නන්ගෙන් මිල ගණන්/ ටෙන්ඩර් කැඳවීමේ අයිතිය බැංකුව සතුව තිබේ.
4. සියලු සැපයුම්කරුවන්ගේ ගෙවීම් සිදුකරනු ලබන්නේ HNBහි පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා පමණි.
5. සැපයුම්කරුවන්ගේ අනන්‍යතාව හඳුනාගැනීම (User ID) ව්‍යාපාර ලියාපදිංචි අංකය වන අතර, එය බැංකුව හා ලියාපදිංචි වීමෙන් පසු වෙනස් කළ නොහැක.
6. ලියාපදිංචි කිරීමේදී සහ ටෙන්ඩර් ක්‍රියාවලියේදී ඉදිරිපත් කරන ලද ලේඛනවල/ තොරතුරුවල නිරවද්‍යතාව/ සත්‍යතාව පිළිබඳ සැපයුම්කරුවන්/ සේවා සපයන්නන් වගකිව යුතු වන අතර කිසියම් වංචනික/ සාවද්‍ය තොරතුරක් හෙළිදරව් වුව හොත් එවැනි සැපයුම්කරුවන්ගේ/ සේවා සපයන්නන්ගේ නාමයන් ලේඛනයෙන් ඉවත් කිරීමට/ අසාදු ලේඛනගත කිරීමට බැංකුවට අයිතිය ඇත.
7. මෙම ලේඛනයේ යම් නියමයන් සහ කොන්දේසි මගින් ආවරණය නොවන වෙනත් ආරවුල් තත්ත්ව ඇතිවුව හොත් ඒ සඳහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ව්‍යාපාරික නීතිය අදාළ වේ.

වැඩිදුර තොරතුරු සඳහා
HNB බැංකු සේවා අංශය හා සම්බන්ධ වන්න.
0112661508/ 0112661894 හෝ email: bsdbvc@hnb.lk

HNB

*කොන්දේසි සහිතයි.